# අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ හදාරා පාසල් අධ්‍යාපනය අවසන් කරන සිසුන්ගේ වෘත්තීය අභිරුචීන් වර්තමාන වැඩ ලෝකයේ පැතිකඩ සමග ගැළපෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක්

( ගම්පහ දිස්ත්‍රික්කයේ ජාතික තරුණ සේවා සභාවට හා
වෘත්තීය පුහුණු අධිකාරියට අයත් මධ්‍යස්ථාන ඇසුරිනි. )

UCLIB
539981

බී.ඒ.ජේ.එච්. බස්නායක
B.A.(Hons.) Second Class Upper Division (Peradeniya)
P.G.D.E. (Colombo)
M.Ed. (Colombo)

උපදේශක :
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය එස්. ගලගමගේ මහතා

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධි අවශ්‍යතා
පූරණය සඳහා ඉදිරිපත් කළ පර්යේෂණාත්මක නිබන්ධයකි.

ලියාපදිංචි අංකය M. phil / 95/03

2007 මැයි

# සංක්ෂේපයෙන්

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) හදාරා පාසල් අධ්‍යාපනය අවසාන් කරන සිසුන්ගේ වෘත්තීය අභිරුචි වර්තමාන වැඩ ලෝකයේ පැතිකඩ සමග ගැලපෙන ආකාරය පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ මෙහෙය වූ මෙම සමීක්ෂණයේ මූලික අරමුණ වූයේ ශ්‍රී ලංකාවේ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හදාරා අවසාන කරන සිසුන්ගේ රැකියා වියුක්තිය ගණනය කිරීම, ශ්‍රී ලංකාවේ කණිෂ්ඨ ද්විතීයික මට්ටමේ සිසුන්ට දැනට ලැබෙන වෘත්ත්‍යාභිමුඛ කිරීමේ වැඩපිළිවෙල අධ්‍යයනය කරමින් ශ්‍රී ලංකාවේ විධිමත් පාසලේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගය අවසාන වන විට එම සිසුන්ට වර්තමාන වැඩ ලෝකයේ රැකියා අවස්ථා සම්බන්ධයෙන් ලබා දෙන අවධානයේ ස්වරූපය මතු කිරීම සඳහා ගත හැකි පියවර විමසීමට යි.

තරුණ ශ්‍රමය ඵලදායී ලෙස ජාතික සංවර්ධනයට ලබා ගැනීම අත්‍යවශ්‍යය. එහිලා විධිමත් පාසලින් අ.පො.ස. (සා.පෙළ) හදාරා පාසල් අධ්‍යාපනය නතර කරන පිරිස විශාල කාර්ය භාරයක් ඉටු කළ හැකි ශ්‍රම බලකායක් බවට පත් කර ගැනීම අවශ්‍ය ය.

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා වූ මෙම අධ්‍යයනයට නියැදිය ලෙස යොදා ගත්තේ ජාතික වෘත්තීය අධිකාරිය හා ජාතික තරුණ සේවා සභාව යි. දිවයින පුරා ම මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන ඉහත කී ආයතන දෙකට අයිති ගම්පහ දිස්ත්‍රික්කයේ මධ්‍යස්ථාන 10 ක, 600 ක පිරිසකගෙන් මෙම අධ්‍යයනයට අදාළ දත්ත ලබා ගැනිණි. ඊට අමතරව එම මධ්‍යස්ථාන ප්‍රධානීන් හා උපදේශකවරුන්ද සුවිශේෂී පුද්ගල නියැදියක් මගින් ද තොරතුර රැස් කෙරුණි.

ලෝකයේ සංවර්ධිත රටවල අධ්‍යාපන රටා හා වෘත්ත්‍යාභිමුඛ කිරීම් පිළිබඳ විමසීමේ දී පෙනී යන වැදගත් කරුණක් නම් රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකම අධ්‍යාපන ක්‍රියාවලිය හා ඒකාබද්ධ වී තිබීමයි. පසල තුළ වෘත්තීය මාර්ගෝපදේශ සේවා ඒකක ක්‍රියාත්මක වීම විවිධ විෂය බාහිර සංවිධාන පාසලට සම්බන්ධ වී උදව් කිරීම, වෘත්තීය නිපුණතා සංවර්ධනය පාසල තුළ දී

විෂය මාලා හා එක්වීම සිදුවීම අධ්‍යාපන දෙපාර්තමේන්තුව සමග අදාළ වෙනත් දෙපාර්තමේන්තු සම්බන්ධ වී තිබීම කර්මාන්ත හා පාසල් අතර සම්බන්ධතාවක් ගොඩනැගී තිබීම ශිෂ්‍ය ආකල්ප වර්ධනයට සුදුසු ක්‍රියාකාරකම් සැලසුම් කොට තිබීම පෞද්ගලික අංශයේ සේවායතන අපේක්ෂිත මට්ටමින් ශිෂ්‍ය හැකියා සංවර්ධනයට පාසල සහාය වීම යන ලක්ෂණ සංවර්ධිත රටවල අධ්‍යාපන පද්ධතිය තුළ දැකිය හැකි විශේෂතා ය. නව සංවර්ධිත රටවල මේ ලක්ෂණ සමග පාසල් පාදක ඇගයීම් හා බැඳුණු ඇගයීම් පටිපාටියට අයිති ක්‍රමවත් විභාග ක්‍රමයක් පැවතීම, කාලීන අවශ්‍යතා මත වෘත්තීය ආයතනවල ක්‍රියාකාරීත්වය, කණිෂ්ඨ ද්විතියික අධ්‍යාපනයේ විෂයමාලාවන්හි විවිධත්වය යන විශේෂතා ද දැකිය හැකිය.

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපනයේ කණිෂ්ඨ හා ද්විතියික විෂයමාලව හා වැඩ ලෝකයේ පැතිකඩ විමසීමේ දී මෑත කාලීනව ඉදිරිපත් කළ 1972, 1981 හා 1997 යන වර්ෂවල ආරම්භ කළ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් සිසුන් වැඩ ලෝකයට නැඹුරු කරවන විවිධ ප්‍රයත්නයන් දක්නට ලැබේ. ප්‍රාග් වෘත්තීය 1 හා 11 ක්‍රියාත්මක කිරීම 1972 ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා ඇති විශේෂතාවකි. වර්ෂ 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ විද්‍යාව හා තාක්ෂණවේදය යන විෂය ඇතුළත් වීම ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් සඳහා විශේෂ ඒකක පිහිටුවීම යන ආදිය සිසුන් වෘත්තීය ක්ෂේත්‍ර වෙත නැඹුරු කිරීමට ගත් ප්‍රයත්නයන් ලෙස හඳුන්වා දිය හැකිය.

රැකියා අවස්ථා පුළුල් වීමත් සමග ඊට අවශ්‍ය සුදුසුකම් ලබා ගැනීම පිළිබඳ ගැටළුවකට සිසුහු මුහුණ දෙති. මේ අධ්‍යයනයට නියැදිය ලෙස තෝරාගත් ජාතික වෘත්තීය පුහුණු අධිකාරියේ හා ජාතික තරුණ සේවා සභාවේ පුහුණු පාඨමාලා හදාරන්නන්ගෙන් ලැබුණු ප්‍රතිචාර මත අ.පො.ස (සාමාන්‍ය පෙළ) පාසල් විෂයමාලාව තුළ වැඩ ලෝකයේ අත්දැකීම් නොමැති වීම නිසා නියමාකාරයෙන් වෘත්තීය නැඹුරුවක් නැති බව සඳහන් කළ හැකිය. මෙවැනි තත්වයක් තුළ අළුතින් නිර්මාණය වන රැකියා ඉල්ලුම සපුරා ලීම සඳහා සිසුන්ගේ වෘත්තීය අභිරුචි තේරුම් ගැනීම අත්‍යවශ්‍යය. ඒ අනුව ප්‍රතිශත භාවිතයෙන් විවිධ විචල්‍ය මත ශිෂ්‍ය රුචිකත්වය විමසීම සිදු කෙරිණි. ස්ත්‍රී-පුරුෂ බව, මවගේ හා පියාගේ අධ්‍යාපනය, මවගේ පියාගේ රැකියාව හා වෘත්තීය

අභිරුචි අතර සම්බන්ධය අධ්‍යයනය කෙරිණි. ශිෂ්‍ය ප්‍රශ්නාවලියේ සිසුන් කැමති රැකියා ක්ෂේත්‍ර, ඒ සඳහා අදාළ සුදුසුකම් ලබා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග හා වැඩි දුර ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තීය දැනුමට අදාල අංශ රැකියා තොරතුරු ලබා ගත හැකි ක්‍රම, වැඩ ලෝකය හා විෂය මාලාවරණය, සමාජ පංති ගරුත්වය හා වැඩ ලෝකය යන ක්ෂේත්‍ර ප්‍රතිශත වගු හා විස්තරාත්මක ක්‍රමය මගින් විශ්ලේෂණය කෙරිණි. රැකියා වියුක්තිය හා පිළියම් සම්බන්ධයෙන් වෘත්තීය පුහුණු අධිකාරියේ හා ජාතික තරුණ සේවා සභාවේ මධ්‍යස්ථාන ප්‍රධානීන් හා උපදේශකවරුන් මෙන්ම සුවිශේෂී පුද්ගල නියැදියක් ද සමග කළ සම්මුඛ සාකච්ඡා මගින් ද ලබා ලත් දත්ත විග්‍රහ කෙරිණි.

නිගමන හා යෝජනා ඉදිරිපත් කිරීම අවසාන පරිච්ඡේදයේ දී සිදුවිය. සිසුන්ට සිය මව, පියා, සහෝදර සහෝදරියන් සහිත පසුබිම මගින් දක්නට ලැබෙන තොරතුරු හා රැකියා පිළිබඳ අදහස් බලපෑමක් ඇති බව දැකිය හැකි විය. තෝරා ගැනීමට තමන් කැමති රැකියා ක්ෂේත්‍ර සමග පවුල් පසුබිම් තොරතුරු විමසීමේ දී එය පැහැදිලි වේ. වෘත්තීන් තෝරා ගැනීමේ දී රාජ්‍ය හා පෞද්ගලික අංශ දෙකේ ම ඕනෑම රැකියාවක් කිරීමේ කැමැත්ත සිසුන් තුළ පවතී. රැකියා ලෝකයේ වැඩි ඉඩප්‍රස්ථා පෞද්ගලික අංශය මගින් ලබා දෙන බව සිසුහු දනිති.

කනිෂ්ඨ ද්විතීයික විෂයමාලාව කාලීන අවශ්‍යතා මත තව දුරටත් පුළුල් කිරීම, රැකියා සපයන බාහිර ආයතන පාසල සමග සම්බන්ධ කිරීම, විධිමත් වෘත්තීය මාර්ගෝපදේශ සේවාවක් පාසල තුළ ක්‍රියාත්මක කිරීම අ.පො.ස (සා.පෙළ) හදාරා පාසල් අධ්‍යාපනය අවසන් කරන සිසුන්ට රැකියා සපයා ගැනීමට සහාය දීම යන කරුණු රැකියා ප්‍රශ්නයට පිළියම් ලෙස යෝජනා කෙරිණි.